**ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

----------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.**

----------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම.**

------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම.

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.1 (ඇ) (ii), (ඈ) (i), (ii) ඡේදවල සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂවලදී මා විසින් සිදු කළ නිර්දේශයන් සමාලෝචිත වර්ෂය තුළදීත් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) වෙනත් ලැබීම්.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාල විසින් යන්ත්‍ර කුලියට දීමෙන් ලබාගත් රු. 415,565 ක මුදල වෙනත් ලැබීම් ලෙස සමාලෝචිත වර්ෂයේ ගිණුමට ඇතුළත් කළ යුතු වුවත් එසේ සිදු නොකර පොදු තැන්පත් ගිණුමට සටහන් කර තිබුණි. | යන්ත්‍ර කුලියට ලබා දීමෙන් ලද රු. 415,565 ක මුදල 2022 මැයි 19 දින රජයේ ආදායමට බැර කර ඇත. | යන්ත්‍ර කුලිය පොදු තැන්පත් ගිණුමෙන් ඉවත් කර වෙනත් ලැබීම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

**(ආ) මූලධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019, 2020 සහ 2021 වර්ෂ 03 ක කාලයක් තුළදී රු. 82,972,483 ක් වැයකර ප්‍රධාන කාර්යාලයේ ඉදි කළ නව තෙමහල් ගොඩනැගිල්ලේ වියදම 281-2-2-01-2001 දරන ගොඩනැගිලි පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම් වැය විෂයය යටතේ දරා තිබුණද එම වියදම සදොස් ලෙස වර්ගීකරණය කර 281-2-2-1-2101 දරන මූලධන වත්කම් අත්පත් කර ගැනීම වැය විෂයය යටතේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ ආරම්භක ශේෂයට එකතු කර තිබුණි. | වෙනත් වැය විෂයයක වියදම් මූලධන වියදම් අත්පත් කරගැනීමේ වැය විෂයයට ඇතුළත් කිරීමට CIGAS පරිගණක වැඩසටහන මගින් ඇතුළත් කළ නොහැකි නිසා එම නීතිමය අවශ්‍යතාවය මත මෙම වියදම වර්ෂයේ 281-2-2-01-2001 යටතේ ගිණුම්වලට ඇතුළත් කර ඇත. | මූලධන වත්කම් අත්පත් කරගැනීම් අදාළ වැය විෂයයෙන් සිදු කළ යුතුය. |

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුවේ පාලන ගිණුමේ ශේෂය රු. 346,356,990 ක් වූ අතර කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂය රු. 344,290,865 ක් වීමෙන් පාලන ගිණුමේ ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අතර රු. 2,066,125 ක වෙනසක් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | වෙනස හඳුනාගෙන නිවැරදි කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ii) | 2021 දෙසැම්බර් 31 දිනට අදාළව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 1,991,743 ක් විය. මෙම ණය ශේෂ 2008 සහ 2009 වර්ෂවල පැණ නැගුණු ණය ශේෂ ලෙස දක්වා තිබුණද 2021 වර්ෂයේදීද අදාළ ශේෂ නිවැරදිව ගිණුම්වල ගලපා නොතිබුණි. | මෙම ශේෂ නිලධාරීන්ගෙන් අය වීමට ඇති ණය ශේෂ නොවන බවත්, නිවැරදිව ගිණුම්වල ගලපා නොමැති බැවින් මෙම ශේෂ ගිණුම්වල පෙන්නුම් කරන බව සඳහන් කර තිබුණි. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතුය. |

**(ඈ) දේපළ පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | 2019 වර්ෂයේ අනුරාධපුරය කලංකුට්ටිය (බුල්නෑව) ගොවිජන සේවා මධ්‍යස්ථාන ගොඩනැගිල්ල දෙපාර්තමේන්තු වියදමින් රු. 9,200,516 ක් වැය කර ඉදි කර තිබුණු නමුත් එය ගොඩනැගිලි හා ඉදිකිරීම් යටතේ දක්වා නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | දෙපාර්තමේන්තුවට අයත් කලංකුට්ටිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල ගිණුම්ගත කළ යුතුය. |
| **(ii)** | 2019 සහ 2020 වර්ෂවලදී ප්‍රධාන කාර්යාලය විසින් මිලදීගෙන ඇති රු. 17,904,713 ක් වටිනා ජල උස මාපක 1,000 ක්, සිතියම් පරිලෝකන යන්ත්‍රයක්, පරිගණක මොනිටර් 04 ක්, පරිගණක මෘදුකාංග පද්ධතියක්, මිහින්තලේ සංචාරක නිවාසය සඳහා ආරක්ෂිත කැමරා පද්ධතියක් සහ ගෘහ භාණ්ඩ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයට ගිණුම්ගත කර නොතිබුණි. | ජල උස මාපක 1000 අතුරින් ජල උස මාපක 206, පරිලෝකන යන්ත්‍රය (Plotter), මොනිටර් 4 සහ පරිගණක මෘදුකාංගය 2022 වර්ෂයේදී ගිණුම් ගත කළ බව දන්වා සිටින අතර මිහින්තලය සංචාරක නිවාසය සඳහා මිලදී ගත් ආරක්ෂිත කැමරා පද්ධතිය සහ ගෘහ භාණ්ඩ 2022 වර්ෂයේදී ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | දෙපාර්තමේන්තුව විසින් මිලදී ගත් වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| **(iii)** | සමාලෝචිත වර්ෂය තුළදී පුරන් කුඹුරු නැවත වගා කිරීම, ගොඩනැගිලි පුනරුත්තාපනය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු. 7,468,522 ක් යොදාගෙන පරිගණක, ගෘහ භාණ්ඩ සහ අදාළ නොවන වෙනත් ඉදිකිරීම් සිදුකර තිබුණි. | 281-2-2-12-2506 වැය විෂයය යටතේ ප්‍රධාන කාර්යාලයේ පරිපාලන වියදම් සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන හා දිස්ත්‍රික්ක 03 බිල්පත් ප්‍රතිපූර්ණයෙන් ඉතිරි වූ මුදලින් පරිගණක, ගෘහ භාණ්ඩ සහ අදාළ නොවන වෙනත් ඉදිකිරීම් සිදු කළ බව. | වත්කම් අත්පත් කරගැනීම් ඊට අදාළ වැය විෂයයන් යටතේ සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(iv)** | 2018 වර්ෂයේදී ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජනායතනය මගින් ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය යටතේ රු. 3,048,117 ක් වටිනා සන්නිවේදන උපකරණ දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණද එම උපකරණ ඉන්වෙන්ට්‍රිගත කර ඒවා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | මෙම සන්නිවේදන උපකරණය දෙපාර්තමේන්තු මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයට ඇතුළත් වී නොමැති බව දන්වා සිටිමි. | අදාළ වත්කම් ගිණුම්ගත කළ යුතුය |

**2.** **මූල්‍ය සමාලෝචනය**

---------------------------

**2.1** **වියදම් කළමනාකරණය**

--------------------------

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 281-2-2-0-2103 විෂයාංකය යටතේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම් සඳහා වූ රු. 15,000,000 ක් වූ මුළු ප්‍රතිපාදන මුදලම උපයෝජනය කර නොතිබුණු අතර 281-2-2-12-2506 හා 281-2-2-13-2506 දරන විෂයාංක දෙක යටතේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රතිපාදිත මුදල පිළිවෙලින් රු. 1,000,000,000 ක් හා රු. 558,633,000 ක් වුවත් එයින් සියයට 23 ක් හා සියයට 55 ක් ඉතිරිව පැවතුණි. | නියමිත පරිදි අවශ්‍ය උපකාරක ලේඛන වල පිටපත් නොලැබීම හේතුවෙන් නිශ්චිත දිනට භාණ්ඩාගාර තැන්පතු ගිණුමට ප්‍රතිපාදන මාරු කිරීමට නොහැකි වීම සහ 2021 වර්ෂය තුළ පැවති වාතාවරණය හේතුවෙන් සැලසුම් කළ පරිදි සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීමට නොහැකි වීම ලෙස දක්වා තිබුණි. | සියලු ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. |
| (ආ) | අංක 281-2-2-0-1303 දරන ගොඩනැගිලි ඉදිකිරීම් නඩත්තු වැය විෂයයේ 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරිවීම් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 29 ක් විය. ඉතිරිවීම් වලට හේතුව ලෙස කොරෝනා තත්ත්වය නිසා නිලධාරීන්ගේ පැමිණීම සීමා වීම දක්වා තිබුණද අතිකාල සඳහා වෙන්වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 98 ක්ම භාවිතා කර තිබුණි. ඒ අනුව නිලධාරීන් තමන්ට හිමි රාජකාරී වේලාවට අමතරව අතිකාල සේවයේ යෙදී තිබීමෙන් ඉහත හේතු දැක්වීම පිළිගත නොහැකි බව නිරීක්ෂණය විය. | ගොඩනැගිලි නඩත්තු හා සුළු අලුත්වැඩියාවන් වෙනුවෙන් අවම වියදමක් සිදුවිය. | ඉතිරිවීම් සඳහා නිවැරදි හේතු දැක්වීම් ඉදිරිපත් කළ යුතුය. |

## 2.2 සීමා ඉක්මවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විසර්ජන පනතින් බලය දෙනු ලැබූ අවම ලැබීම් සීමාව රු. 290,000,000 ක් වුවත් දෙපාර්තමේන්තුව විසින් තත්‍ය වශයෙන් වර්ෂය තුළ රු. 272,460,566 ක් පමණක් අයකර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | විසර්ජන පනතින් බලය ලබාදී තිබුණු සීමාවන් උල්ලංඝනය වන්නේ නම් එම සීමා සංශෝධනය කරවා ගත යුතුය. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මු.රෙ. 94.1 ප්‍රකාරව වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තු මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් එක් පුනරාවර්තන වැය විෂයයක සහ මූලධන වැය විෂයයන් 03 ක ඉතිරි වීම් ඉක්මවා රු. 20,145,216 ක බැරකම්වලට එළඹී තිබුණු බව නිරීක්ෂණය විය. | CIGAS වැඩ සටහනෙහි මෙම වර්ෂයේ නිවැරදි කිරීමට නොහැකි වීම හේතුවෙන් තව දුරටත් ගෙවිය යුතු ශේෂයක් ලෙස පෙන්නුම් කරනු ලබන අතර මෙම වසරේ මෙම ශේෂයන් නිවැරදි කරමින් බැඳීම් බැරකම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දන්වමි. | ඉතිරි වීම් ඉක්මවා වියදමකට හෝ බැඳීමකට වලට නොඑළඹිය යුතුයි. |

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) **කාබනික පොහොර මිලදී ගැනීම හා පරිහරණ වියදම් වැඩසටහන** | | |
| කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ 426-2-03-001-1504 දරන සහනාධාර පොහොර මිලදී ගැනීම හා පරිහරණ වියදම් වැය විෂයයෙන් 2021 වර්ෂයේ ලැබුණු රු. 1,330,468,500 ක ප්‍රතිපාදන මුදලින් රු. 1,183,531,515 ක් පමණක් පොහොර මිලදී ගැනීම හා පරිහරණ වියදම් වෙනුවෙන් වැයකර | අදහස් දක්වා නොතිබුණි. | වෙනත් ආයතනවලින් ලැබෙන ප්‍රතිපාදන අදාළ කාර්යය සඳහා පමණක් යොදාගත යුතුය |

| | | | |
|---|---|---|---|
| | සදොස් ලෙස ඉතිරි ප්‍රතිපාදනයෙන් රු. 31,493,999 ක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාහන අලුත්වැඩියා කිරීම, රක්ෂණ වාරික ගෙවීම, ඉන්ධන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම හා කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය හා දිරිදීමනා ගෙවීමේ ප්‍රචාරක කටයුතු වෙනුවෙන් වැයකර තිබුණි. | | |
| (ආ) | **ජීවතුරු උදාන වැඩසටහන**<br>---------------------------- | | |
| | කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ අංක 03/2021 දරන 2021 අප්‍රේල් 05 දිනැතිව “ජීවතුරු උදාන” ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලැබී තිබුණි. මේ සඳහා කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය මගින් රු. 21,000,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර මුරුංගා පැළ 418,363 ක් ගොවිජන සේවා මධ්‍යස්ථාන 516 ක් සඳහා බෙදා දීම වෙනුවෙන් රු. 17,592,246 ක් හා දැනුවත් කිරීම් වියදම වෙනුවෙන් රු. 350,999 ක් වැයකර තිබුණි. බස්නාහිර පළාත තුළ සිදු කළ භෞතික විගණන පරීක්ෂාවේදී බෙදා දීමට තිබුණු පැළ නිසියාකාරව බෙදා නොදීම, ගොවිජන සේවා මධ්‍යස්ථානවල පැළ මැරීම, පැළ ලබාගත් පුද්ගලයින් එම පැළ නිසියාකාරයෙන් සිටුවා නඩත්තු නොකිරීම සහ ලබාදුන් පැළ සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් සිදු නොකිරීම විගණනයට අනාවරණය විය. එබැවින් එම ව්‍යාපෘතියට දරන ලද රු. 17,943,245 ක මුදල අනාර්ථික වියදමක් විය. | මෙම වැඩසටහනේ ප්‍රගතිය දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවල දී සාකච්ඡා කර පසුවිපරම් කිරීමට අදාළ ප්‍රගති සමාලෝචන වැඩසටහන් සකස් කර ඇති බව දන්වමි. | ලද ප්‍රතිපාදන නිසි අධීක්ෂණයක් ඇතිව අපේක්ෂිත ප්‍රතිලාභ ලැබෙන පරිදි උපයෝජනය කළ යුතුය |
| (ඇ) | **ගම සමඟ පිළිසඳරක් වැඩසටහන**<br>---------------------------------- | | |
| | අංක 429-02-03-002-2506 දරන වැය විෂයය යටතේ ගම සමඟ පිළිසඳර වැඩසටහන මගින් දිස්ත්‍රික්ක 12 ක සුළු වාරිමාර්ග යටතේ පවතින වැව් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 62 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් | වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2021 වර්ෂය අවසානයට ප්‍රතිපාදන ලබාදීම නිසා අදාළ ව්‍යාපෘති සිදු කිරීමට නොහැකි විය. | ලද ප්‍රතිපාදන වර්ෂය තුළදී උපයෝජනය කළ යුතුය |

2021 වර්ෂයේ රු. 108,126,600 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. ඉන් ව්‍යාපෘති 37 ක් සම්පූර්ණයෙන් නිමකර තිබුණු අතර අම්පාර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති 02 ක වැඩ ආරම්භ කර නොතිබුණි. තවත් ව්‍යාපෘති 16 ක ඉදිකිරීම් කටයුතු සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණු අතර ඉතිරි ව්‍යාපෘති 07 සියයට 51 ත් සියයට 75 ත් අතර මට්ටමක පැවතුණි.

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | | |
| | | **රු.** | | | |
| (අ) | **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | | | |
| | **2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 51(1) වගන්තිය** | - | ගොවිජන සංවර්ධන සභා පිහිටුවා නොතිබුණි. | ගොවිජන සංවර්ධන පනතට අදාළව නියෝග සකස් කර, එම නියෝග භාෂා ත්‍රිත්වයට පරිවර්තනය කර 2021 අප්‍රේල් 30 දින නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. | ගොවිජන සංවර්ධන සභා පිහිටුවිය යුතුය. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| | (i) මු.රෙ. 104(1)(අ) | - | පාඩුවක් හෝ අලාභ හානියක් හෝ සිදු වූ වහාම වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කර තිබුණත් 2014, 2019, 2020 සහ 2021 වර්ෂවලදී සිදුවූ වාහන 08 ක අනතුරු සම්බන්ධයෙන් අදාළ වාර්තා 2022 | අදහස් දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ පරීක්ෂණ සිදු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අප්‍රේල් 30 දින දක්වා ලබා දී නොතිබුණි. | | |
| (ii) මු.රෙ. 571 | - | දෙපාර්තමේන්තුවට අයත් වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු නියාදනය කළ යුතු වුවත් රු. 140,470,793 ක් වටිනා තැන්පතු නියාදනය නොකර 2021 දෙසැම්බර් 31 දින දක්වා පැවතුණි. | භාණ්ඩාගාරයෙන් අක් මුදල් ලැබීම හා එම මුදල් කළමනාකරණය කිරීමේ හැකියාව අනුව ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. | කල් ඉකුත්වූ තැන්පතු මුදල් රෙගුලාසි ප්‍රකාරව නියාදනය කළ යුතුය. |
| (iii) මු.රෙ. 756 | - | දෙපාර්තමේන්තුව සතු නාරාහේන්පිට ගබඩා දෙකෙහි ඇති භාණ්ඩ පිළිබඳ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවද සිදුකර නොතිබුණි. | මෙම වර්ෂය අවසන් වීමට පෙර අදාළ ක්‍රියාවලිය අවසන් කිරීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂිකව සමීක්ෂණ කටයුතු සිදු කළ යුතුය. |
| (iv) මු.රෙ. 1647 (ආ) | - | වාහන 526 ක සහ උපකරණ පිළිබඳව වර්ෂ 05 කට වැඩි කාලයක සිට සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන සහ උපකරණ පිළිබඳ සමීක්ෂණයක් සිදු කළ යුතුය. |

(ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

-------------------------

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | 2018 ජනවාරි 24 දිනැති 05/2018(1) අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසිලාභී ප්‍රඥප්තියක් සකස් කළ යුතුය. |
| (ii) | 2018 ජනවාරි 24 දිනැති 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කරමින් පවතින බව දන්වමි. | චක්‍රලේඛ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) **දෙපාර්තමේන්තු චක්‍රලේඛය** | | | |
| ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 1981 ඔක්තෝබර් 16 දිනැති 107 චක්‍රලේඛයේ 30(iii) වගන්තිය | 2020 වර්ෂයට අදාළව ගොවිජන සේවා කාරක සභා මූල්‍ය ප්‍රකාශන 07 ක් හා 2021 වර්ෂයට අදාළව ගොවිජන සේවා කාරක සභා මූල්‍ය ප්‍රකාශන 495 ක් 2022 මාර්තු 31 දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

## 2.6 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාල 17 ක් විසින් දිස්ත්‍රික්කවලට අයත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 396 කින් එකතුව රු. 109,875,327 ක මුදලක් නැවත ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ලබාගෙන තිබුණි. ඇතැම් ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් රු. 3,520,000 ක් වැනි විශාල මුදල් ප්‍රමාණයක් ලබාගෙන ඇති බව නිරීක්ෂණය විය. 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල් පියවා නොතිබුණු අතර එදිනට බැරකම්වලටද ඇතුළත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ගොවිජන සේවා කාරක සභා පනත යටතේ පිහිටවූ ස්වාධීන ආයතනයක් වන බැවින් දිස්ත්‍රික් කාර්යාල විසින් ලබාගත් රු. 109,875,327 ක මුදල ආපසු එම ගොවිජන සේවා මධ්‍යස්ථානවලට ගෙවිය යුතුය. |

## 2.7 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 1,528,452 ක් වූ අතර එයින් වර්ෂ 10 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂය රු. 517,284 ක් විය. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර කටයුතු කර ශේෂ නිරවුල් කරගත යුතුය. |
| (ආ) | පළාත් සභා සඳහා මාරුවී ගිය වැඩ තහනම් කළ, සේවය හැරගිය, මැය ගිය සහ වෙනත් ණය ශේෂවල 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු. 19,222,940 ක් වූ අතර එයින් වර්ෂ 05 කට වැඩි ණය ශේෂය රු. 9,055,217 ක් විය. | අදහස් දක්වා නොතිබුණි. | පළාත් සභා ණය ශේෂ අප්‍රමාදව නිරවුල් කළ යුතු අතර විනය ක්‍රියාමාර්ග මගින්, ඇපකරුවන්ගෙන් |

| | | |
|---|---|---|
| | | සහ විශ්‍රාම වැටුපෙන් අදාළ නිලධාරීන්ගේ ණය ශේෂයන් වෙනත් සුදුසු ක්‍රමයක් අනුගමනය කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.8 තැන්පත් ශේෂයන්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් කාර්යාල 07 ක වර්ෂ 02 සිට 05 දක්වා කාලයක සිට පැවත එන කොන්ත්‍රාත් රැඳවුම් රු. 13,770,864 ක් 2021 දෙසැම්බර් 31 දින දක්වා නිදහස් කර නොතිබුණි . | නිරවුල් කිරීමට නොහැකි වූ රැඳවුම් අදාළ වාර්තා ලබා ගැනීමෙන් පසුව හා ප්‍රමාණවත් අක් මුදල් භාණ්ඩාගාරයෙන් ලැබීමෙන් පසුව ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | කොන්ත්‍රාත්තුවේ පවතින අඩුපාඩු සම්පූර්ණ කරවාගෙන නොපමාව රැඳවුම් මුදල් නිදහස් කළ යුතුය |
| (ආ) | දිස්ත්‍රික් කාර්යාල 11 ක් මගින් එකතු කළ අක්කර බදු, යන්ත්‍ර කුලී, රක්ෂණ වන්දි, වෙන්දේසි ආදායම, ණය වාරික වැනි ලැබීම් රු. 10,218,418 ක් ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය නොකර එම කාර්යාලවල පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි. | ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය නොකළ රු. 10,218,418 ක් වූ ලැබීම් ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | 2021 වර්ෂයට අදාළ අක්කර බදු, යන්ත්‍ර කුලී, රක්ෂණ වන්දි, වෙන්දේසි ආදායම, ණය වාරික වැනි ලැබීම් 2021 දෙසැම්බර් 31 දිනට පෙර ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය කළ යුතුය |

**2.9 බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාල 26 ක බැංකු සැසඳුම්වල ඇතුළත්ව තිබුණු ගෙවීම සඳහා ඉදිරිපත් නොවුණු රු. 11,011,822 ක් වටිනා චෙක්පත් 385 ක් සම්බන්ධයෙන් මු.රෙ. 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රු. 3,336,303 ක චෙක්පත් නිශ්කාෂණය වී ඇති අතර, ඉතිරි රු. 7,675,268 ට අදාළ චෙක්පත් නිශ්කාෂණය කිරීම සඳහා හෝ මු.රෙ. 396 (ඇ) ප්‍රකාරව ඉදිරියේ දී කටයුතු කරන බව දන්වා සිටිමි. | මු.රෙ. 396 (ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඇස්තමේන්තුගත පිරිවැය රු. 54,523,455 ක් වූ සුළු වාරිමාර්ග ව්‍යාපෘති 27 ක් 2021 දෙසැම්බර් 31 දින වන විට අවසන් කළ යුතු වුවත් රු. 33,444,278 ක් වැය කර එම ව්‍යාපෘති 23 ක් පමණක් නිමකර තිබුණි.<br>(ආ) ඇස්තමේන්තුගත පිරිවැය රු. 200,000,000 ක් වූ පොහොර ගබඩා 52 ක් ඉදිකිරීම 2021 දෙසැම්බර් 31 දින වන විට අවසන් කළ යුතු වුවත් රු. 130,768,929 ක වියදමක් දරා ඉදිකිරීම ආරම්භ කළ ගබඩා 29 ක වැඩ අවසන් කර නොතිබුණි. | මෙම ව්‍යාපෘති 2021 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කිරිමට නොහැකි වීමට 2021 වර්ෂයේ පැවති වසංගත රෝග තත්ත්වය, අයහපත් කාලගුණික තත්ත්වය සහ ඇස්තමේන්තුගත මිල ගණන් ඉහළ යාම හේතු වී ඇති බව දන්වා සිටිමි. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 අගෝස්තු 28 දිනැති 02/2020 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | රට තුළ පැවති තත්ත්වය හේතුවෙන් 2020 කාර්යසාධන වාර්තාව නියමිත කාල සීමාව තුළ අවසන් කිරීමට නොහැකි වූ අතර, මේ වන විට කාර්ය සාධන වාර්තාව අවසන් කොට අමාත්‍යාංශ අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ඇත. අනුමැතිය ලද පසු කාර්ය සාධන වාර්තාව පරිවර්තනය හා පිටපත් කිරීම සිදු කර මෙම වර්ෂය තුළ පාර්ලිමේන්තු සභාගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කළ යුතුය. |

### 3.3 විදේශ ආධාර ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2005 – 2008 වර්ෂවලදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ජල පොම්ප හා බිංදු ජල තාක්ෂණය යොදා ගැනීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත රු. 2,327,272,272 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර 2018 වර්ෂය අවසන් වන විට මෙම පද්ධති සඳහා සියලුම මුදල් | කෘෂිකර්ම අමාත්‍යාංශය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව එක්ව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ගොවිජන සේවා කාරක සභා/ගොවිජන බැංකු (නියමු ව්‍යාපෘති) ගිණුම් වල රඳවාගෙන ඇති මුදල්, ලේකම් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස උපදෙස් දී ඇත. | ගිවිසුම් අනුව සියලුම මුදල් කඩිනමින් අයකර අවසන් කළ යුතුය |

අයකර අවසන් කළ යුතු වුවත් 2021 වර්ෂය අවසන් වන විට රු. 2,264,753,696 ක මුදලක් අය කරගෙන නොතිබුණි. 2022 වර්ෂය වන විට අය කරගත් මුදලින් කිළිනොච්චිය, බදුල්ල සහ යාපනය යන දිස්ත්‍රික් කාර්යාලවල ගොවි බැංකුවල රු. 1,848,600 ක මුදලක් රඳවාගෙන තිබුණි. 2022 වර්ෂය වන විට ලබා දී තිබුණු පද්ධතිවලින් සියයට 90 ක් අස්ථානගතව, අභාවිතව, ගොවීන්ගේ තොරතුරු සොයාගත නොහැකිව සහ අක්‍රීයව පැවති බව නිරීක්ෂණය විය. ඒ අනුව ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 3.4 ප්‍රසම්පාදන

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගොවීන් අතර බෙදා දීම සඳහා උදළු තල, මුල්ලු, වතුර ඉසින භාජන 600 බැගින් 2021 නොවැම්බර් 10 දින මිලදී ගත් බව දක්වමින් රු. 1,355,400 ක මුදලක් රජයේ වාණිජ සංස්ථාවට ගෙවා තිබුණද, අදාළ භාණ්ඩ ගබඩාවට ලැබුණු බවට සහ ගොවීන් අතර බෙදා දුන් බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගොවීන් අතර බෙදා දීම සඳහා මිල දී ගත් උදළු තල, මුල්ලු, වතුර ඉසින භාජන 600 බැගින් යටියන්තොට ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ප්‍රවාහනය කිරීමෙන් අනතුරුව නිකුත් කිරීමේ නියෝග මඟින් යටියන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දී ඇත. | දෙපාර්තමේන්තුව ලබාගත් සියලුම භාණ්ඩ ගබඩාව වෙත ලබාදිය යුතු අතර ගොවීන් වෙත ලබා දීමේදී ඒ සඳහා ලිඛිත සාක්ෂි ලබාගත යුතුය |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදනවලින් රු. 1,579,332 ක වැය කර ඉදි කළ පානදුර බොජුන්හළට පිවිසීමට තරප්පු පෙළක් ඉදිකර නොතිබීම නිසා මධ්‍යස්ථානයේ කමිටු අරමුදලින් රු. 197,000 ක් වැයකර තරප්පු පෙළක් ඉදිකර තිබුණද 2022 මැයි 31 දින වන විටත් බොජුන්හළ අභාවිතව පැවතුණි. | රටෙහි පැවති වසංගත තත්ත්වය හේතුවෙන් පානදුර බොජුන්හල විවෘත කිරිමට නොහැකි වූ අතර ඉදිරි මාසයේදි මෙම බොජුන්හල විවෘත කර පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි. | අප්‍රමාදව බොජුන්හළ විවෘත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලෝක ආහාර ව්‍යාපෘතියෙන් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ CR– 0098 දරන ජීප් රථය 2015 වර්ෂයේ ලියාපදිංචිය සිදුකර භාවිතයට ගත හැකිව තිබූ නමුත් එම වර්ෂයේ සිටම මාලඹේ රථවාහන අංගනයේ ගාල් කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | CR– 0098 දරන ජීප් රථය ලියාපදිංචි කර ධාවනයට ගත යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 25 ක රෝද 04 ට්‍රැක්ටර් 174 ක්, රෝද 02 ට්‍රැක්ටර් 43 ක්, ට්‍රැක්ටර් ට්‍රේලර් 95 ක්, ගොයම් කපන යන්ත්‍ර 69 ක්, තැටි නඟුළු / කොකු නඟුලු 256 ක්, මඩවීල් 293 ක් සහ වෙනත් උපකරණ 796 ක් ආදී වත්කම් වර්ෂ 06 සිට වර්ෂ 24 ක කාලයක සිට අක්‍රියව, අභාවිතව පැවති අතර අදාළ වත්කම් අපහරණය කර නොතිබුණි. | මේ වනවිට රෝද 04 ට්‍රැක්ටර් 49, රෝද 02 ට්‍රැක්ටර් 12, ට්‍රැක්ටර් ට්‍රේලර් 08, තැටි නඟුල් / කොකු නගුල් 52, මඩ වීල් 58, ගොයම් කපන යන්ත්‍ර 20 සහ වෙනත් 91ක් අපහරණය සඳහා ඉතිරිව පවතින අතර මඩ වීල් 58, ගොයම් කපන යන්ත්‍ර 20 සහ වෙනත් 91ක් අපහරණය කර ඇත. | වත්කම් දිරාපත් වීමට ප්‍රථම අපහරණ කටයුතු සිදු කළ යුතුය. |
| (ඈ) | දෙපාර්තමේන්තුව යටතේ පවතින දිස්ත්‍රික් කාර්යාල 20 ක, ගොවිජන සේවා මධ්‍යස්ථාන 252 ක, යාන්ත්‍රික අංගන 03 ක සහ ප්‍රධාන කාර්යාලයේ ඉඩම් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉඩම් තක්සේරු කර ඉදිරියේදී CIGAS වැඩසටහනට ඇතුළත් කරනු ලබන බව දන්වා සිටිමි. | දෙපාර්තමේන්තුවට අයත් සියලු ඉඩම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | දෙපාර්තමේන්තුව සතු ගොවිජන සේවා මධ්‍යස්ථාන 447 ක, යාන්ත්‍රික අංගන 03 ක ගොඩනැගිලි හා ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි 03 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි. | ගොඩනැගිලි තක්සේරු කර ඉදිරියේදී CIGAS වැඩසටහනට ඇතුළත් කරනු ලබන බව දන්වා සිටිමි. | දෙපාර්තමේන්තුවට අයත් සියලු ගොඩනැගිලි ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | පුත්තලම දිස්ත්‍රික් කාර්යාලයට අයත් රජකඳලුවේ පොහොර ගබඩාව තක්සේරු කර දිස්ත්‍රික් කාර්යාලයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | අදාළ ගොඩනැගිල්ල තක්සේරු කර වටිනාකම මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | දෙපාර්තමේන්තුවට අයත් රජකඳලුවේ පොහොර ගබඩා ගොඩනැගිල්ල ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2015, 2018, 2019 සහ 2020 වර්ෂවල අපහරණය කිරීමට තීරණය වූ යන්ත්‍ර හා වාහන 41 ක් සහ ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාල 05 ක පරිගණක විදුලි උපකරණ, ලී බඩු යනාදී භාණ්ඩ අපහරණය සිදුකර ඒවා මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයෙන් ඉවත් කිරීමට කටයුතු සිදුකර නොතිබුණි. | 2020 භාණ්ඩ සමීක්ෂණයට අදාළව අපහරණය කළ යුතු භාණ්ඩ අපහරණය කිරීමට නොහැකි වූ අතර වාහන 14 ක අපහරණ කටයුතු මේ වන විට සිදු වේ. අපහරණයෙන් පසු පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරමි. | අපහරණය කිරීමට නියමිත උපකරණ වර්ෂය තුළදී අපහරණය කර ගිණුම්වලින් ඉවත් කළ යුතුය |
| (ඊ) | 2017 ජූනි 26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙන් 07 ඡේදය ප්‍රකාරව ඉඩම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අපහරණය කරන ලද වත්කම් පිළිබඳ තොරතුරු පමණක් මේ වන විට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ බව කාරුණිකව දන්වා සිටිමි. | වර්ෂය තුළදී මිලදී ගත් වත්කම් සහ අපහරණය කරන ලද වත්කම් අදාළ චක්‍රලේඛය පරිදි කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය |
| (උ) | 2019 ජූලි 04 දින අංක LY – 1616 දරන හීනෝ වර්ගයේ ප්‍රයිම් මූවර් රථය සහ අංක LY – 2183 දරන ට්‍රැක්ටර් ට්‍රේලරය ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට හා 2020 ජූනි 25 දින අංක LJ – 2842 දරන බවුසරය නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට නිදහස් කර ඇති බව යාන්ත්‍රික අධිකාරී විසින් විගණනයට වාර්තා කර ඇතත් ඒවා විධිමත්ව පවරා දී මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙන් ඉවත් කිරීමට කටයුතු සිදුකර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | වෙනත් රාජ්‍ය ආයතනවලට පවරා ඇති වත්කම්වල අයිතිය නීත්‍යානුකූලව පවරා දී ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මු.රෙ. 770 (4) (ආ) ප්‍රකාරව විශේෂ සමීක්ෂණ මණ්ඩලයක නිර්දේශය අනුව, 2015 වර්ෂයේ අපහරණය කළ යුතු යන්ත්‍ර 02 ක්, 2018 වර්ෂයේ අපහරණය කළ යුතු යන්ත්‍ර 07 ක් සහ 2019 වර්ෂයේ අපහරණය කළ යුතු වාහන 26 ක් 2022 අප්‍රේල් 30 දින දක්වා අපහරණය කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි අපහරණ කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | නාගරික සංවර්ධන අධිකාරියෙන් සංවර්ධන බලපත්‍රය ලබා නොගෙන දෙපාර්තමේන්තුව විසින් රු. 82,972,483 ක් වැය කර ඉදි කළ නව තෙමහල් ගොඩනැගිල්ලේ අපද්‍රව්‍ය බැහැර කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකස් නොකිරීම, ගොඩනැගිල්ලේ වැසිකිලි පද්ධතිය භාවිතා කිරීමට නොහැකි වීම සහ ප්‍රමාණ බිල්පත්වල සඳහන් කාර්යය 74 ක් සිදු නොකිරීම යනාදී අඩුපාඩු විගණනයට නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | නාගරික සංවර්ධන අධිකාරියෙන් බලපත්‍රය ලබාගෙන අඩුපාඩු සම්පූර්ණ කළ යුතුය. |

**3.6 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලයේ සිදුවූ වර්ෂ 01 සිට වර්ෂ 18 දක්වා කාල සීමාව තුළ පැවත එන රු. 2,505,752 ක රිය අනතුරු අලාභ ශේෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශයේ ඉදිරියට ගෙනා ශේෂය යටතේ දක්වා නොතිබුණි | අදහස් දක්වා නොතිබුණි. | පාඩු හා හානි සම්බන්ධව පවත්නා අසාමාන්‍ය ප්‍රමාදය වළක්වා ගත යුතුය. සිදුව ඇති අලාභය වහාම අයකර ගත යුතුය |

**3.7 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙත 2019 ගිණුම් වර්ෂය සඳහා නිකුත් කළ විගණන විමසුම් 61 කට, 2020 ගිණුම් වර්ෂය සඳහා නිකුත් කළ විගණන විමසුම් 74 කට සහ 2021 ගිණුම් වර්ෂය සඳහා නිකුත් කළ විගණන විමසුම් 47 කට 2022 මැයි 09 දින දක්වාම පිළිතුරු එවා නොතිබුණි. | අදාළ විගණන විමසුම් සඳහා පැහැදිලි කිරීම් නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව ද දන්වා සිටිමි. | නියමිත කාල සීමාව තුළ විගණන විමසුම්වලට පිළිතුරු ලබාදිය යුතුය. |

**3.8 කළමනාකරණ දුර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මු.රෙ. අංක 104 යටතේ සිදුකරන ලද පරීක්ෂණවලට අනුව නිලධාරීන් 35 කගෙන් අයවිය යුතු රු. 9,547,689 ක මුදල අයකර ගැනීමට 2021 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | විස්තරාත්මකව අදහස් දක්වා තිබුණි. | අසාමාන්‍ය ප්‍රමාදයක් නිරීක්ෂණය වන හෙයින් නොපමාව සියලු පරීක්ෂණ අවසන් කිරීමට සැලසුම් කළ යුතුය. |
| (ආ) | ගොවීන්ගේ භාරකාර අරමුදලින් අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය සඳහා 2015/2016, 2019/2020, 2020/2021 වර්ෂවලදී බඩඉරිඟු වගා කිරීම සඳහා රු.326,990,000 ක් ලබා දී තිබුණු අතර 2022 අප්‍රේල් 30 දින වන විට රු. 56,560,010 ක් අයවිය යුතුව පැවතුණි. | ණය අයකරගැනීම සඳහා විනිශ්චය සභාව වෙත කඩිනමින් යොමුකිරීමට කටයුතු කරමින් පවති. | අඛණ්ඩව පසු විපරම් කර කඩිනමින් ණය අය කරගත යුතුය. |
| (ඇ) | 2020 වර්ෂයේදී බිත්තර වී ලබා ගැනීම සඳහා ගොවීන්ගේ භාරකාර අරමුදලින් රු. 25,000,000 ක මුදලක් මාස 06 කින් අය කර ගැනීමේ පදනම මත ලබා දී තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට තව දුරටත් අය විය යුතු මුදල රු. 8,314,910 ක් විය. | අදහස් දක්වා නොතිබුණි. | අඛණ්ඩව පසු විපරම් කර ණය අයකර ගත යුතුය. |
| (ඈ) | කාබනික පොහොර ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කළ "සාරලංකා" වැඩසටහන යටතේ 2016, 2017, 2018 වර්ෂවල දිස්ත්‍රික් කාර්යාල 21 ක ගොවීන් 318 ක් වෙනුවෙන් රු. 69,850,000 ක ණය මුදලක් ගොවීන්ගේ භාරකාර අරමුදලින් ලැබී තිබුණු අතර එම මුදලින් 2022 ජුනි 15 දින වන විට රු.24,916,492 ක මුදලක් තවදුරටත් අයවිය යුතුව තිබුණි. කාර්යාලයේ ඉපලෝගම ගොවිජන සේවා මධ්‍යස්ථානයේ රු.500,000 ක ණය ලබාගත් පුද්ගලයෙකු 2022 පෙබරවාරි 08 දින දක්වා කිසිදු වාරිකයක් ගෙවා නොතිබුණි. | මෙම හිග ණය මුදල් අයකර ගැනීම සඳහා විනිශ්චය සභාවට යොමුකර ඇත. | අඛණ්ඩව පසු විපරම් කර ණය අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2000/2007 කාලය තුළදී වී මිල දී ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් දෙපාර්තමේන්තුව වෙත ඍජුවම අත්තිකාරම් ලබාදී තිබුණු අතර බදුල්ල සහ අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාල වලින් අයවිය යුතු මුදල රු. 12,552,764 ක් විය. | බදුල්ල හා අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාල විසින් පරීක්ෂණ කටයුතු පවත්වා අයවිය යුතු මුදල් අයකරගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට අදාළ ණය මුදල පියවීමට කටයුතු කළ යුතුය |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 **දෙසැම්බර්** 31 දින වන විට දෙපාර්තමේන්තුවේ මුළු පුරප්පාඩු සංඛ්‍යාව 3,384 ක් වූ අතර පුරප්පාඩු තනතුරු 20 ක් සඳහා අනුමත සේවක සංඛ්‍යාවෙන් එක් සේවකයෙකුවත් බඳවාගෙන නොතිබුණි. | කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය ලබාදුන් උපදෙස් පරිදි සේවකයින් බඳවා ගැනීම සඳහා මූලික කටයුතු සිදුකර තිබුණ ද මෙතෙක් පත්වීම් කර නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම් කල් තැබීමට තීරණය කර ඇති බැවින් ඉදිරි කටයුතු සිදු නොකරන ලදී. | අප්‍රමාදව පුරප්පාඩු පිරවීමට හෝ කාලීනව සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගත යුතුය |